# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2019 ජූලි මස 12 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2019.07.12 දින නිකුත් කරන ලදී)**


## මරණ දණ්ඩනය අහෝසි කිරීමේ

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**මරණ දණ්ඩනය අහෝසි කිරීම සහ ආනුෂංගික විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## මරණ දණ්ඩනය අහෝසි කිරීමේ

### මරණ දණ්ඩනය අහෝසි කිරීම සහ ආනුෂංගික විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2019 අංක      දරන මරණ දණ්ඩනය අහෝසි කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මරණ දණ්ඩනය අහෝසි කිරීම.

**2.** කිසියම් පනතක මරණ දණ්ඩනය නියම කිරීම හෝ මරණ දඬුවමින් දඬුවම් කිරීම සම්බන්ධයෙන් කර ඇති සඳහනක්, මෙම පනත ක්‍රියාත්මක වීම සමග සහ ඉන් පසුව, ජීවිතාන්තය දක්වා සිර දඬුවමින් දඬුවම් කිරීම ලෙස සංශෝධනය වූයේ යැයි සැලකිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

**3.** (අ) මෙම පනත ක්‍රියාත්මක වීමට පෙර යම් පුද්ගලයකුට මරණ දණ්ඩනය නියම කර තිබේ නම්, එම පුද්ගලයා එම වරද සම්බන්ධයෙන් ජීවිතාන්තය දක්වා සිර දඬුවමට නියම වූ පුද්ගලයකු ලෙස සැලකිය යුතු ය.

(ආ) මෙම පනත ක්‍රියාත්මක වීමට පෙර යම් පුද්ගලයකු මරණයෙන් දඬුවම් කළ හැකි වරදක් සිදු කර ඇති නමුත්, ඒ සම්බන්ධයෙන් අධිකරණයකින් දඬුවමක් නියම කොට නොමැති නම්, එම පුද්ගලයා ජීවිතාන්තය දක්වා සිර දඬුවමකින් දඬුවම් ලැබිය හැකි වරදක් කර ඇති පුද්ගලයකු ලෙස සැලකිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.